# පළමුවන ලෝක යුද්ධය ඇති වීමට බලපෑ හේතු සහ එය ලෝක ඉතිහාසයේ වැදගත් සංධිස්ථානයක් වීම

**ඩබ්ලිව්.එම්. හිරාන් මධුසංක**
තාවකාලික ප්‍රදර්ශක, පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලය
hiran6361@gmail.com

**සංක්ෂේපය**

ලෝක ඉතිහාසයට අඳුරු පැල්ලමක් එක් කළ එක් අවස්ථාවක් ලෙසින් මේ පළමු ලෝක යුද අවස්ථාව හඳුන්වා දිය හැකිය. විවිධ වු හේතූන් නිසා ආර්ථික දේශපාලන හා සාංග්‍රමික වශයෙන් ප්‍රබල වී සිටි රාජ්‍යයන් සමූහයක් එකම අරමුණක් වෙනුවෙන් ක්‍රියාත්මක විමේදී තරඟයක් ඇතිවීම ස්වභාවික තත්ත්වයකි. යුදාසන්න අවස්ථාවේදිද ඇතිවුයේ මෙවැන්නකි. එකිනෙකා කෙරේ වූ සැකය හා අවිනිශ්චිත බව නිසාද කලක් තිස්සේ පැවැති එකිනෙකාගේ සිත්වල සැඟවුණු යුද්ධය සැබෑ ලෙසින් කරළියට ගෙන ඒමට ද ආසන්නතම සිද්ධිද ඇතිවිය. ඒ සමඟ යුරෝපය එකම පොර පිටියකට එක්වු අතර යුධ ගුවන් නාවුක යන ත්‍රිවිධ වූ හමුදාවන් සෑම රටක් විසින්ම මේ සඳහා යොදවන ලදී. නවීන තාක්ෂණයේ බලපෑම මේ සඳහා ඍජුවම ලැබුණ හෙයින් ලෝකයට තාක්ෂණික වශයෙන් නවාංග එක් කරලීමටත් මෙතෙක් නොවූ විරූ අන්දමේ ආර්ථික සමාජ හා දේශපාලන වෙනස්කම් රාශියක් ලෝකයට හඳුන්වාදිමටත් මේ යුද අවස්ථාව උපකාරි විය. එහෙයින් මේ පළමු ලෝක යුද අවස්ථාව ලෝක ඉතිහාසයේ නව සංධිස්ථානයක් ලෙසින් සැලකීම සාවද්‍ය නොවේ.

**හැඳින්වීම**

මධ්‍යතන යුගයේ වැඩසවම් බැම්වලින් මිදුණු යුරෝපීය ප්‍රදේශ ස්වාධිනත්වය කරා ළඟාවිමට එක්සත් බව පැතූහ. එහිදී විසිරි තිබු එක් එක් ජන කොටස්වලට අයත් ප්‍රදේශ එක් තනි රාජ්‍යය ඒකකයක් දක්වා වර්ධනය වීම දක්නට ලැබේ. එක් ප්‍රධානියෙක් යටතේ රැස්වන ජනයා ජාතිකත්වය පෙරටු කොටගෙන ජාතික රාජ්‍යය යන සංකල්පය ඔස්සේ ස්වාධින රාජ්‍යය ගොඩ නඟා ගනී. එසේ එක්සත් වන රාජ්‍යය අතර ජර්මනිය ඉතාලිය වැනි යුරෝපීය රාජ්‍යය කැපී පෙනේ. මෙසේ එක්සත්ව ස්වාධින බව ළඟා කරගන්නාවු මේ රාජ්‍ය පසු කල් වෙත්ම ධනයෙන්, තාක්ෂණයෙන්, පහසුකම්වලින් මෙන්ම ශ්‍රම බලයෙන් අන් රාජ්‍යය අභිබවා නැගි සිටිමට සමත් වේ. ඒ සඳහා මේ රාජ්‍යවලට ආසියා, අප්‍රිකා මහද්විපවල පැවත් යටත් විජිතවලින් සුවිසල් ධනයක් ගලා ආවේය. එහෙයින්ම මේ රටවල තාක්ෂණය දියුණු විය. චින්තනය උසස් විය. යුරෝපයේ එදා පැවැති බොහෝ රාජ්‍යය මෙන්ම ඇමරිකාවද දියුණු තත්ත්වයක පැවතියේය. එමෙන්ම නැගෙනහිරින් ජපානයද මෙකී තත්ත්වය ඇති කරගෙන සිටියේය. මෙම තත්ත්වයේ ප්‍රතිඵලය නම් එකිනෙකාට අභියෝග කළ හැකි අන්දමේ බලවත් රාජ්‍ය ගණනාවක් බිහිවීමයි. මෙම රාජ්‍යවල මීළඟ අභිප්‍රාය වූයේ රාජ්‍යයෙන් පිටත බලය ව්‍යාප්ත කිරිමයි. ඒ සඳහා මෙකල යුරෝපීය බොහෝ රාජ්‍යය වචනයෙන් නොකියන ලද යටිබිම්බගත ප්‍රයත්නයන්හි නිරත විය.

විසිවන සියවසේ මුල් දශකයේදි පමණක් ලෝකය (විශේෂයෙන්ම යුරෝපය) සාමකාමි ලෙසින් දෘශ්‍යමාන වුවත් දෙවන දශකයේ මැද භාගයේදී එම සාමය අභියෝගයට ලක්වේ. කාලයක් තිස්සේ රාජ්‍යයන් අතර පැවති උණුසුම, වචනයෙන් නොකී ප්‍රයත්න හෙවත් එකිනෙක කෙරේ තිබූ සැකය හා අවිශ්වාසය ප්‍රායෝගිකව කරළියට පැමිණෙන්නේ යුද්ධයක් ලෙසිනි. ඒ පළමුවන ලෝක යුද්ධයයි. එකිනෙකාට අභියෝග කළ හැකි අන්දමේ එකිනෙකාට නොදෙවෙනි බලයක් හිමි කරගෙන සිටි මේ රටවල් තම බලය ප්‍රදර්ශනය කිරිමට මගක් බලමින් සිටියහ. හේතු සාධක රැසක් ඇතිව එම සාධකවල අවසන් ප්‍රතිඵලය ලෙසින් පළමු ලෝක යුද්ධය ඇතිවන්නේ ලෝක ඉතිහාසයෙන්ම කිසිදා නොමැකිය හැකි කළු පැල්ලමක් සනිටුහන් කරමිනි. ක්‍රි.ව 1914 සිට ක්‍රි.ව 1918 දක්වා කාලයේ පවතින මේ යුද්ධය යුරෝපා යටත් විජිතකරාද චක්‍රාකාරව විහිදී යයි. යුරෝපා ඉතිහාසයේ මෙන්ම ලෝක ඉතිහාසයේම සංධිස්ථානයක් සේ සලකන්නාවු මේ යුද්ධය ඇතිවීමට

පසුබිම් වූ හේතු කාරණා 19 වන සියවසේ සිටම ඇති වෙමින් පැවතිණි. ඒ පසුබිම් වූ හේතු මෙසේ අධ්‍යයනය කළ හැකිය.

- ඔටෝ වොන් බිස්මාර්ක්ගේ ප්‍රතිපත්ති
- ඇල්සාස් ලෝරේන් සඳහා වූ ප්‍රශ්න
- යුරෝපීය රටවල් යටත් විජිත සඳහා තරඟ වැදි සිටීම
- ජර්මනියේ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තිය
- ජර්මනියේ මෙන්ම බ්‍රිතාන්‍යයේ ආර්ථික ප්‍රතිපත්ති
- යුරෝපය දෙපිලකට බෙදී සිටීම
- යුද අවි පිළිබඳ වූ තරඟය
- බෝල්කන් ප්‍රශ්න
- සරයේවෝ සිද්ධිය

යනාදී හේතු රාශියක් මේ යුද්ධය ඇතිවීම සඳහා පසුබිම් විය. මේ හේතු හා පසුබිම පහත අයුරින් විග්‍රහ කර අධ්‍යයනය කළ හැකිය.

**2. ලෝක යුද්ධය ඇතිවීමට බලපෑ හේතු**

**ඔටෝ වොන් බිස්මාර්ක්ගේ ප්‍රතිපත්ති**

ව්‍යාකුලව හා විසිරී පැවැති ජර්මන් ජාතිකයින්ගෙන් සැදුම්ලත් රාජ්‍ය ගණනාවක් කලක සිට එක්සත් බව පතා විවිධ ක්‍රියා මාර්ග ගත්හ. නමුත් ඒ ඒ රාජ්‍යය එක්සත් කර ඒකීය ජර්මනියක් පිහිටුවීමට ඒ කිසිඳු උත්සාහයකට නොහැකි විය. නමුත් අවසානයේදී ඒ උත්සාහය සාර්ථක කරනු ලබන ප්‍රබල දේශපාලන චරිතය වන්නේ ජර්මන් චාන්ස්ලර් වූ ඔටෝ වොන් බිස්මාර්ක්ය. තමන්ගේ අති ශූර වූ දේශපාලනික ඥානය මෙහෙයවමින් කිසි විටෙක පරාජය නොවී කපටි ප්‍රයෝග මගින් අන් රටවල් සහයෝගයෙන් තබා දේශපාලන ක්‍රියා මාර්ග මගින් ක්‍රි.ව 1871 දී එක්සත් ජර්මනියක් බිහි කිරීමට ඔහු සමත් විය. ඒ එතැන් සිට එහු විසින් ගෙන ගියේ ජර්මනියේ උන්නතිය සඳහා වූ ප්‍රතිපත්තිය. ඇතැම් විටෙක ඒවා අන් රටවලට බාධාකාරී හෝ අන් රටවල් සඳහා බලපෑම් කරන්නාවූ අන්දමේ ප්‍රතිපත්ති විය. ඔහු මේ සියලු ප්‍රත්පත්ති ගෙන ගියේ එක්සත් වූ ජර්මනිය ආරක්ෂා කර ගැනීම සඳහාය. මේ වන විටදී ජර්මනියට යුරෝපයේ සිටි සතුරා වූයේ ද ජර්මනිය එක්සත් කිරීමේදි බාධකය වූයේද ප්‍රංශයයි. එහෙයින් ප්‍රංශයට වර්ධනය වීමට හෝ සෙසු රටවල් හා සහයෝගීතාවක් ඇති කර ගැනීමට ඉඩ නොදී ප්‍රංශය යුරෝපයේ තනි කිරීමට පියවර ගත්තේය ඒ සඳහා බිස්මාර්ක් සිදු කළේ යුරෝපයේ බලවතුන් කිහිප දෙනක් හා මිත්‍ර වීමයි. ඒ මගින් ජර්මනිය ශක්තිමත් කිරිමට පියවර ගත්තේය. ඒ මගින් ජර්මනිය ඒ මිත්‍ර රටවල් අතර ප්‍රමුඛයා මෙන්ම කේන්ද්‍රස්ථානය වශයෙන් තබා ගැනීමටද සමත් විය මේ සහයෝගීතාව සඳහා එක් නිදසුනක් නම් ක්‍රි.ව 1873 දී රුසියාව ඔස්ට්‍රියාව හා එක්වී අධිරාජ්‍යවාදීන් තිදෙනාගේ සංගමය නිර්මාණය කර ගැනීමයි. පසුකාලීනට රුසියාව මේ හවුලින් ඉවත් වුවත් රුසියාව හා දිගින් දිගටම සබඳතා ගෙන යාමට බිස්මාර්ක් ක්‍රියා කළේය.

පසුව මේ ගිවිසුම් හා මිත්‍ර සන්ධාන ප්‍රතිපත්තිය තව දුරටත් ගෙන යාමේ අපේක්ෂාවෙන් ඔස්ට්‍රියාව හා ජර්මනිය එක්ව යුධ ගිවිසුමක් ඇති කර ගත් අතර ඒ සඳහා ඉතාලියද ඈඳා ගත්තාසේම 1882 දී යුරෝපා බලවතුන්ගේ මිත්‍ර හවුල ගොඩ නැගීය. මේ ඔස්ට්‍රියාවත් ඉතාලියත් මෙකල යුරෝපයේ බලවත් රටවල් සේ වැජඹෙමින් පැවතිණ. බිස්මාර්ක්ගේ අරමුණු වූයේ තමන්ට ආසන්න වූ බලවත් රාජ්‍යය තමාගේ මිත්‍රයන් සේ ළං කර ගැනීමයි. එයින් ආරක්ෂාව ස්ථාවර කර ගැනීමට හැකිවිය. මේ ගිවිසුම් ක්‍රමය නිසා යුරෝපය පිල් දෙකකට බෙදීමේ ප්‍රවණතාවක් ඇතිවිය. කෙසේ නමුත් කුමන බාධක හමුවේ වුවත් මේ ගිවිසුම් දක්ෂ ලෙසින් ඉදිරියට ක්‍රියාත්මක කර ගෙන යාමට බිස්මාර්ක් සමත් විය. නමුත් 1890 දි දෙවන විලියම් අධිරාජ්‍යයා විසින් බිස්මාර්ක් බලයෙන් නෙරපීමත් සමඟ එයින් පසු බලයට පත් පාලකයන්ට මේ ගිවිසුම් පෙර පරිදි දක්ෂ ලෙසින් ඉදිරියට ගෙන යාමට නොහැකි විය. එහි ප්‍රතිඵලය වූයේ ජර්මනියේ ප්‍රධානම සතුරා වූ ප්‍රංශය මෙවැනිම

අයුරේ මිත්‍ර සන්ධාන ගත වී තවත් ප්‍රබල පිලක් සාදා ගැනීමයි. බිස්මාර්ක් විසින් එතෙක් වළක්වා තිබූ උත්සාහයන් නව පාලකයා ක්‍රියාත්මක කරනු ලැබීය මේ නව පාලකයාගේ ප්‍රතිපත්ති නිසා ජර්මනිය මේ තරඟයට එක්වුවත් ඊට පසුබිම බිස්මාර්ක් විසින් ඇතිකරනු ලැබ තිබිණි. එහෙයින් යුරෝපය පිල් දෙකකට බෙදී යාම වළක්වාලිය නොහැකි විය. බිස්මාර්ක්ගේ මෙම ප්‍රතිපත්ති හා ගිවිසුම් අවසන් වූයේ යුරෝපය දෙපිළකට බෙදීමෙනි.

**ඇල්සාස් ලෝරේන් සඳහා වූ ප්‍රශ්න**

ක්‍රි.ව 1871 වන තෙක් විසිරී තිබූ රාජ්‍ය ගණනාවක් එක්සත් කොට ජර්මන් රාජ්‍යය පිහිටුවන ලදි. ඒ ව්‍යාපාරයේදී ජර්මනියේ ප්‍රධානම බාධාව වූයේ ප්‍රංශය බවත් මේ සඳහා යුද්ධ දෙරට අතර පැවැති බවත් උක්ත සඳහන් කළෙමු. එහිදී ප්‍රංශය සතුවූ ඇල්සාස් හා ලෝරේන් ප්‍රදේශද ජර්මනියට ඈඳා ගැනිණ. මෙතැන් සිටම ප්‍රංශය ක්‍රියාත්මක වන්නේ ඒ ප්‍රදේශ නැවත ප්‍රංශයට ලබා ගැනීමටයි. ස්වභාවික සම්පත් අතින් අතිශය පොහොසත් වූ මේ ප්‍රදේශ දෙපිළටම ඉතා වාසිදායක විය. ඒ නිසා මේ ප්‍රදේශ මුල් කරගෙන විවිධ කාල වකවානුවලදී ප්‍රංශය හා ජර්මනිය අතර ගැටුම් හා එදිරිවාදිකම් ඇතිවිණි. දෙපිරිස අතර කාලාන්තර විරසකයක් ඇති කිරීමට මේ ප්‍රශ්නය ප්‍රමාණවත් විය. නමුත් පළමු ලෝක යුද්ධය අවසන් වී ජර්මනිය පරාජය වීමත් සමඟ ජයග්‍රාහී පිල විසින් ඇතිකළ වර්සෙල්ස් ගිවිසුම් ප්‍රකාරව මේ ප්‍රදේශ නැවත ප්‍රංශයටම හිමි විය.

**යුරෝපීය රටවල් යටත් විජිත සඳහා තරඟ වැදි සිටීම**

යුරෝපා රටවල වෙළඳ ව්‍යාපාරවල ප්‍රතිඵලයක් ලෙසින් යටත් විජිතවාදය ආරම්භ විය. මුල්කාලීනව ස්පාඤ්ඤය පෘතුගාලය වැනි ජාතීහු මේ ව්‍යාපාරයේ නියැලී හුන්හ. පසු කල් වෙත්ම එංගලන්තය, ප්‍රංශය, ජර්මනිය වැනි රටවල් මේ සඳහා යොමු විය. ඒ මේ රටවල්වලින් ලැබෙන අති විශාල ධනස්කන්දය දෙස බැලීමෙනි. විශේෂයෙන්ම ආසියා අප්‍රිකා රටවල් මේ යටත් විජිතවාදයට ලක් වි සිටි අතර අප්‍රිකාවේ යටත් විජිත පිහිටුවා ගැනීමේදී මේ රටවල් අතර ගැටුම්ද ඇතිවිය. යටත් විජිත පිහිටුවා ගැනිම අතින් බ්‍රිතාන්‍යය ඉදිරියෙන් සිටියේය. ඍජුවම කිවතොත් අප්‍රිකාව බලවතුන්ගේ තරඟ බිමක් බවට පත්විය. මෙසේ අප්‍රිකාවේ රටවල් එක් එක් වර්ෂවලදී මෙසේ බ්‍රිතාන්‍යට යටත් විය.

| | |
|---|---|
| බසුටෝලන්තය | 1868 |
| සෝමලිලන්තය (කොටසක්) | 1864 |
| කෙන්යාව | 1887 |
| දකුණු රොඩේසියාව | 1889 |
| උතුරු රොඩේසියාව | 1890 |
| සන්සිබාව සහ පෙන්බා | 1890 |
| උගන්ඩාව | 1894 (අලහකෝන්,2011,පි. 4) |

මෙසේම මෙකල යුරෝපයේ තවත් යටත් විජිත පිහිටුවා ගන්නා බලවතෙක් වූ ප්‍රංශය විසින්ද අප්‍රිකා මහද්වීපයේ යටත් විජිත පිහිටුවීම සිදු කරන ලදී.

| | |
|---|---|
| ඇල්ජීරියාව | 1848 |
| සෝමාලිලන්තය (කොටසක්) | 1883-1887 |
| ටියුනිසියාව | 1881 |
| ඩහෝමි | 1893-1894 |
| මැඩගස්කාව | 1895 |

අයිවරි කෝස්ට් 1899

චැඩ් 1900 (අලහකෝන්,2011,පි. 5)

නමුත් මේ තරඟය සඳහා යුරෝපා බලවතෙක් වූ ජර්මනිය එක් වූයේ නැත. ජර්මනියට අවශ්‍ය වූයේ රට අභ්‍යන්තරික වශයෙන් ශක්තිමත් කිරීමයි. මුලදී ජර්මනිය විසින් තම කාර්මික කටයුතු ශක්තිමත් කර ගන්නා අතර පසුව 1880 න් පසු යටත් විජිතකරණයට එක්වේ. ඒ අනුව 1884 දී නිරිත දිග අප්‍රිකාවේ රටවල්ද කැමරූන් රාජ්‍යයද ජර්මනියට යටත් විය. මෙකලම බටහිර අප්‍රිකාවේ රාජ්‍යයන්ද කෙන්යාවේ දකුණු දිග ප්‍රදේශද යටත් විය. මේ කාලයේ බ්‍රිතාන්‍ය ප්‍රංශය ජර්මනිය මෙන්ම තවත් බොහෝ රටවල් යටත් විජිතකරණයේ නියැලීම නිසා රටවල් අතර දැඩි තරඟයක් ඇති විය. මෙතෙක් විශාල යටත් විජිත ප්‍රමාණයක් හිමිකරගෙන සිටියේ බ්‍රිතාන්‍යයයි. බලවත් වූ ජර්මනියද මේ තරඟයට එක්වීම නිසා බ්‍රිතාන්‍යයට එය තර්ජනයක් විය. යටත් විජිත ඇති කර ගැනීම මේ රටවල් සඳහා දෙ ආකාරයකට වැදගත් විය. ඒ නම්

- තම නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍ය ලබා ගැනීමට
- තම නිෂ්පාදන අලෙවි කර ගැනීමේ වෙළඳපළක් නිර්මාණය කරගැනීමට ය.

මේ වන විටදී යුරෝපා රටවල් කාර්මික විප්ලවයෙන් බොහෝ ජයග්‍රහණ හිමිකරගෙන සිටියහ. ඒ සමඟ නිෂ්පාදනය වූ භාණ්ඩ අලෙවි කර ගැනීමේ වෙළඳපළක අවශ්‍යතාව දැනුණු හෙයින් ඒවා යටත් විජිත කෙරේ යොමු කිරීමට හැකිවිය. එසේම එකී නිෂ්පාදන සඳහා යුරෝපයේ පැවතියේ සීමිත සම්පත් ප්‍රමාණයකි. නමුත් ඒ සඳහා ගල් අඟුරු, ලෝහ සඳහා අමුද්‍රව්‍ය වන ටින් ආකර, මිනිරන් රත්රන් වැනි විවිධ ඛනිජ ද්‍රව්‍ය හා බොහෝ සම්පත් යටත් විජිත සතුව පැවතිණ. එහෙයින් මේ යටත් විජිත ඇතිකර ගැනීම විශාල වාසිදායක තත්ත්වයක් විය. මේ යටත් විජිත තරඟය කොතෙක්ද යන්න පෙනී යන්නේ 1870 න් පසුව ජර්මනිය විසින් නිරිත දිග හා නැගෙනහිර අප්‍රිකාවද ප්‍රංශය විසින් බටහිර පෙදෙස් ද ඉතාලිය උතුරු රාජ්‍යයන්ද බෙල්ජියම කොංගෝ ප්‍රදේශයද යනාදී ලෙසින් අල්ලා ගෙන සමස්ත අප්‍රිකාවම වාගේ යුරෝපීය බලවතුන්ගේ රාජධානියක් කර ගැනීමෙනි. (සෙනෙවිරත්න,1966,පි. 173) මේ ලෙසින්ම ආසියා ප්‍රදේශවලත් යුරෝපා ජාතිහු යටත් විජිත ව්‍යාප්තියේ නියැලී සිටියහ. සැබැවින්ම කියතොත් රාජ්‍යයන් අතර තරඟය හා යුද්ධයකට ආසන්නතම හේතුවක් වූයේද අප්‍රිකාවෙන් පිටතටත් යටත් විජිත ව්‍යාප්ත කිරීමට උත්සාහ ගැනීමයි. ලෝකය බෙදා ගැනීම සඳහා යුරෝපා ජාතින් අතර කලක් තිස්සේ පැවති තරඟය ලෝක යුද්ධයකට එක් හේතුවක් වී යැයි කීම සාවද්‍ය නොවේ.

අප්‍රිකා යටත් විජිත කෙරේ වූ තරඟය නිසාම බර්ලින් සම්මේලනය ඇති කරන ලදී. මේ සම්මේලනයේ එක් පරමාර්ථයක් වූයේ '' **අනුහස් වැයික්කිවල මායිම් නියම කිරීමයි** ". (තොම්සන් ,1970,පි. 471) බටහිර රාජ්‍යයක් විසින් අප්‍රිකා රාජ්‍යයක් නියම ලෙස අල්ලා ගත්විට එය සෙසු ජාතීන්ට දැන්වීම මඟින් එහි අයිතිය ඒ අදාල රාජයය සතු යැයි නීතියක් සම්මත විය. රුසියාව හා ජපානය අතර චීනයේ වෙළඳ අයිතිය ලබා ගැනීම සඳහා වූ මතභේදය උතුරු අප්‍රිකාවේ යටත් විජිත සම්බන්දයෙන් ප්‍රංශය හා ජර්මනිය අතර ඇතිවූ මතභේදය ආදී වූ මතභේද ප්‍රති විරුද්ධ බලවතුන්ගේ එදිරිවාදිකම් හා සැකය තවදුරටත් වර්ධනය කිරිමට හේතු ම විය.

### ජර්මනියේ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තිය

බිස්මාර්ක්ගෙන් පසුව ජර්මනියේ බලයට පත්වූ දෙවන විලියම්ට බිස්මාර්ක්ගේ දේශපාලන ප්‍රතිපත්ති අවබෝධ කර ගැනීමට නොහැකි විය. ඔහුගේ එකම අපේක්ෂාව වූයේ හැකි ඉක්මනින් ජර්මනියේ ව්‍යාප්තිය දැකීමයි. ජර්මනියේ බල ව්‍යාප්තියත් යටත් විජිත ඇතිකර ගැනීමත් ඔහුගේ එක් අරමුණක් විය. එයම හේතු කරගෙන ඔහු විසින් මුලින්ම බිස්මාර්ක් බලයෙන් පහ කරනු ලැබීය. මෙසේම ජර්මනිය විසින් තම බල වර්ධනය අරමුණු කරගෙන වෙනත් රටවලට මැදිහත් වීම මඟින් ලෝකයට ජර්මනිය සතුරෙක් සේ පෙනී ගියේය. බර්ලින් බැග්ඩෑග් දුම්රිය මාර්ගය ඉදිකිරීමට තුර්කියට ආධාර දීම ඒ සඳහා නිදසුනකි. ඒ හරහා ආසියාව කෙරේද තම බලය ව්‍යාප්ත කළ හැකි බව ජර්මනිය විශ්වාස කළේය.

මෙම අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තියේදී ජර්මනිය කැපී පෙනුණ අතර වෙනත් රටවල්ද ඒ සඳහා යොමු වී සිටියේය. **නව අධිරාජ්‍යවාදය** ලෙසින් හැඳින්විය හැකි මේ තත්ත්වය මේ යුරෝපා බලවත් රටවල පාලක රජයයන්ගේ **රාජ්‍ය නිර්බාධවාදී ප්‍රතිපත්තිය** නිසා ප්‍රසාරණය විය. ආර්ථික කයටුතු කෙරේ රජය මැදිහත් නොවී පුද්ගලික අංශයටත් ඒ සඳහා ඉඩ ප්‍රස්ථා ලබා දීම මෙහිදී සිදුවිය. එහෙයින් සෑම බලවත් යුරෝපා රටක්ම වාගේ අධිරාජ්‍යවාදී කටයුතුවල නිරත විය. එසේම රාජ්‍ය මට්ටමින් හෝ වෙනයම් අයුරකින් අධිරාජ්‍ය ව්‍යාප්තියේ හා වෙළඳ කටයුතුවල නියැලිණි. මේ වන විටදී ජර්මනිය යුරෝපා බලවතා වූ අතර බ්‍රිතාන්‍යය ලෝක බලවතා විය.

**යුද අවි පිළිබඳ වූ තරඟය**

යුරෝපයේ සෑම රටක්ම කාර්මික විප්ලවයෙන් ලත් මඟ පෙන්වීමෙන් නව තාක්ෂණය හඹා ගියේය. අනිකාට වඩා උසස් දෙයක් ඇති කිරීම හෝ සොයා ගැනීමේ පිපාසාවෙන් සියලු ජාතීහු පෙලුණහ. යුද අවි නිපදවීම කෙරේ සියලු ජාතීන් අවධානය යොමු කළේ ඉදිරියට ඇතිවන තත්ත්වය කල් තියා දැනගත්තාක් මෙනි. සබ්මැරීන් යාත්‍රා, යුද්ධ ටැංකි, විෂ වායු යනාදිය නවීන ආයුධ වූ අතර මීට පෙර භාවිත වූ ඒවාද නොවීය. යටත් විජිත හා දේශ සීමාවන් පාලනය කල ප්‍රධානතම මාර්ගය වූයේ මුහුදු මාර්ගයි. එහෙයින් නාවුක ශක්තිය කෙරේ සෑම යුරෝපීය රටක්ම වැඩි අවධානයක් යොමු කළේය. 1895 දී ජර්මනිය විසින් කීල් ඇල කපා නාවුක බලය තහවුරු කර ගැනිමට උත්සාහ කළේය. එසේම 1900දී පැනවූ ජර්මන් නාවුක පණත්ද අද්මිරාල් ඇල්ෆ්‍රඩ් ෆොන් ටිර්පිට්ස් යටතේ ජර්මනිය විසින් තම නාවුක ශක්තිය දියුණු කරන ලදී. එයට ප්‍රතික්‍රියා ලෙසින් බ්‍රිතාන්‍යය යල් පැනගිය නාවුක තාක්ෂණය වෙනුවට සර් ජෝන් ෆිෂර් යටතේ තම නාවුක ශක්තිය වර්ධනය කර ගත්තේය. මේ සමඟම බ්‍රිතාන්‍යය විසින් දියුණු තාක්ෂණය උපයෝගී කරගනිමින් යුධ නැව් නිර්මාණය කළ අතර පැයට සැතපුම් 22 වේගයෙන් ගමන් කළ හැකි හා සැතපුම් අටක් දුරට කාලතුවක්කු ප්‍රහාර දිය හැකි පහසුකම්ද ඒවායේ ස්ථාපිත කර තිබුණි. 1914 පමණ වන විටදී මේ වර්ගයේ නැව් 20ක් බ්‍රිතාන්‍ය සතුවූ අතර 17 ක් ජර්මනිය සතු විය. (යුරොපා ඉතිහාසය,පි. 196) මෙලෙසින්ම 1906 දී බ්‍රිතාන්‍යය විසින් බලවත් නවීන යුද නැවක් වූ ඩ්‍රෙඩ්නෝට් යුද නෞකාව තනන ලදී.

යුද අවි ආයුධ කෙරේ උනන්දුව කොතෙක්ද යත් ඒ වෙනුවෙන් ඕනෑ තරම් වියදම් කිරිමට රටවල් කිසි විටෙක මැලි නොවීය. 1889 හා 1914 අතර කාලයේ අවි ආයුධ නිශ්පාදනය කිරිම සඳහා **බ්‍රිතාන්‍යය ඔස්ට්‍රෝ හංගේරියාව, ප්‍රංශය, රුසියාව සහ ඉතාලිය** වැය කළ මුදල් පහත පරිදි පෙන්වා දිය හැකිය.

1889 ඇමරිකන් ඩොලර් දස ලක්ෂ 130

1900 ඇමරිකන් ඩොලර් දස ලක්ෂ 274

1912 ඇමරිකන් ඩොලර් දස ලක්ෂ 310

1913 ඇමරිකන් ඩොලර් දස ලක්ෂ 335 (අලහකෝන්,2011,පි. 9)

ජර්මනිය සතුව ප්‍රබල පාබල හමුදාමය බලයක් පැවැති අතර පැය 36 කාලයකදී පුහුණුව ලත් ලක්ෂ 65 ක හමුදාවක් ක්ෂණිකව සන්නද්ධ කිරීමට හැකියාවක් තිබුණි. ප්‍රමාණයෙන් හා ගුණාත්මක බවින් ඉහළ යුද අවි මෙකල ජර්මනිය සතු විය. මෙසේම ප්‍රංශයද පුහුණු භටයන් ලක්ෂ දහයක් හදිසි අවස්ථාවක කැඳවීමට හැකිවන පරිදි සූදානම් කර තැබීය. අවශ්‍ය වුවහොත් මේ භටයන් පැය 48කදී සන්නද්ධ කිරිමටද හැකි විය. ජර්මන් ආයුධ තරම් ගුණාත්මක නොවුවද එවකට ලෝකයේ තිබූ විශිෂ්ඨතම යුද අවිය වූ මි.මී 75 තුවක්කුව ප්‍රංශය සතු විය. රුසියාවද යුද ශක්තියක පිහිටා සිටියද උක්ත කී රටවල් මෙන් කාර්යක්ෂම තත්ත්වයේ නොවීය. මේ ආයුධ තරඟයෙන් පෙනී යනුයේ මේ රටවල් යම් ගැටුමකට සූදානමින් හෝ එවැන්නක් බලාපොරොත්තුවෙන් සිටි බවයි. මේ වන විටදී එවැන්නක් ඇති වී නොතිබුණද යම් අවස්ථාවක් එළඹෙන තුරු රැඳී සිටීමක් හෝ සූදානම් වීටක් සිටීමක් මෙමඟින් පෙන්නුම් කළේය.

**යුරෝපය දෙපිලකට බෙදී සිටීම**

ජර්මන්යේ නව පාලකයාට අවශය වූයේ ජර්මනියෙන් පිටතට රාජ්‍යය ව්‍යාප්ත කිරීම බව කලින් සඳහන් කළෙමු. මේ නව ප්‍රත්පත්ති හේතුවෙන් ජර්මනිය ඔස්ට්‍රියාව හා මිත්‍ර වීම දක්නට ලැබේ. ඒ අනුව 1891 දි පමණ රුසියාව ප්‍රංශය හා මිත්‍ර සන්ධාන ගත විය. ජර්මනිය හා බ්‍රිතාන්‍යය නාවුක සාකච්ඡා බිඳී ගියෙන් බ්‍රිතාන්‍යය තම මතය තහවුරු කර ගත්තේය. ජර්මනිය අනාගත යුද්ධයකට අර අඳින බව වටහා ගත් බ්‍රිතාන්‍යය ජර්මනියේ සතුරු වූ ප්‍රංශය හා මිතුරු විය යුතු බව අවබෝධ කර ගත්තේය. ඒ සඳහා දිගු කාලීන අමනාපකම් අත්හැර සංග්‍රාමික අවස්ථාවකදී යුද හා නාවුක අතින් මෙන්ම ආර්ථික සංවිධාන අතින්ද එක්වී ක්‍රියා කිරීමේ එකමුතුවකට දෙරට කැමති විය. ඒ 1904 වර්ෂයේදිය. මෙහිදි ප්‍රංශ නාවුක හමුදාව මධ්‍යධරණී මුහුද ආරක්ෂා කිරීම භාරගත් අතර බ්‍රිතාන්‍යය උතුරු මුහුද ආරක්ෂා කළේය. මේ වන විටදි ප්‍රංශය රුසියාව හා මිත්‍ර වි සිටි හෙයින් එංගලන්තයද ඒ පිළිවෙතම අනුගමනය කරන ලදී ඉංග්‍රිසි රුසියන් ප්‍රශ්න සාමකාමීව විසඳා 1907 දී පමණ දෙරට අතර මිත්‍රත්වයක් ගොඩ නගා ගන්නා ලදී. 1908 පමණදි ජර්මනිය ඔස්ට්‍රියාව ඉතාලිය ප්‍රමුඛව එක් කඳවුරක්ද එංගලන්තය ප්‍රංශය රුසියාව එක් පිළක්ද බෙදී සිටියහ. සෑම සියලු අතින්ම සංවිධාන ගත වී සිටි මේ බලවතුන්ට දැන් අවශ්‍ය වූයේ යුද්ධයක් ඇතිවීම සඳහා ආසන්නතම හේතුවක් පමණි.

**බෝල්කන් රාජ්‍යවල ප්‍රශ්න**

අප්‍රිකාවේ මෙන් යුරෝපා බලවතුන් නැවත තරගයකට එක්වන්නේ මේ බෝල්කන් රටවල් මූලික කරගෙනය. නැගෙනහිර යුරොපීය රටවල් වූ මේවා (බොස්නියාව, හර්සිගොවිනාව, සර්බියාව) කලක් තිස්සේ තුර්කි අධිරාජ්‍යයට යටත් වී පැවතිණ. මේ කාලය වන විටදී තුර්කි අධිරාජ්‍යය බිඳී යමින් තිබූ අතර ඒ ආශ්‍රයෙන් මේ රටවල් අල්ලා ගැනීමට ඔස්ට්‍රියා හංගේරියා ජර්මන් ප්‍රංශ වැනි බටහිර රටවල් උත්සාහ ගත්හ. මේ බෝල්කන් රාජ්‍යවලටද අවශ්‍ය වූයේ නිදහස දිනා ගැනීමටයි. ඒ වෙනුවෙන් මේ රටවල විසූ ජාතීන් වූ ස්ලාව් වැසියන් එක්සත් කිරීමේ ව්‍යාපාරයක් ක්‍රියාත්මක විය. බොස්නියාව මේ ව්‍යාපාරයේ මූලික වී සිටියේය. ඔස්ට්‍රියාවේ අදහස වූයේ මේ රටවල් අල්ලා ගැනීම වූ අතර ඒ සඳහා තම මිතුරා වූ බලවත් ජර්මනිය සෑම අවස්ථාවකදීම තමන් හා සහයට සිටින බව වටහා ගත් ඔස්ට්‍රියාව වඩාත් දරුණු ක්‍රියා මාර්ග අනුගමනය කරන ලදී. ඒ අනුව 1908 දී ඔස්ට්‍රියාව විසින් බොස්නියාව හා හර්සගොවිනාව ඈඳා ගන්නා ලදී. මෙයින් වඩාත් බියට පත් වූයේ සර්බියාවයි. ඒ ළඟට ඔස්ට්‍රියාවේ ප්‍රහාරය තමන්ට එල්ල වන බව දත් නිසාය. මේ බොල්කන් ප්‍රශ්න විසඳීමට මහ ජාතීන්ගේ සම්මේලනයක් කැඳවීමේ සිහිනයද නිශ්ඵල වී ගියෙන් සර්බියාව බලාපොරොත්තු රහිත තත්ත්වයකට මුහුණ දීමට සිදුවිය. ඔස්ට්‍රියාවේ මෙම ඈඳා ගැනීමේ අවස්ථාව 1878 සාම ගිවිසුම කඩ කිරීමක් වැන්නක් විය. මේ සිද්ධියෙන් පැහැදිලිවම පෙනී ගියේ ජර්මනිය හා ඔස්ට්‍රියාව බොල්කන් රටවල් ගිල ගැනීමට එක්වී සිටින බවයි. යුරෝපා ජාතිහු මෙයට එරෙහිව ක්‍රියාකරන්නට වූ හෙයින් තරඟකාරී බව හා අවදානමක් ඇති විය. ඍජුවම කිවහොත් අප්‍රිකාවේ පැවැති තත්ත්වය දැන් බොල්කන් ප්‍රදේශවල දැකිය හැකි විය.

1833 උන්කෙයාර්ස් කෙලෙස්කි ගිවිසුම, 1841 ලන්ඩන් සාම ගිවිසුම, 1856 පැරිස් සාම ගිවිසුම, සේන්ට් ස්ටෙෆානෝ ගිවිසුම යන ගිවිසුම් වරින් වර ඇතිවන්නේ මේ බෝල්කන් රාජ්‍ය බෙදා ගැනීමට බටහිර ජාතීන් ගත් උත්සාහයන්හි ප්‍රතිඵල ලෙසිනි. මේ ගිවිසුම් මඟින් ඇතැම් විට බටහිර ජාතීන්ට වාසි අවාසි සිදුවූ අතර එයද මතභේද ඇති කිරීමට ප්‍රමාණවත් විය. බෝල්කන් ප්‍රශ්නයට මැදිහත් වීමෙන් එංගලන්තයට අවශ්‍ය වූයේ වෙළඳ මාර්ග ආරක්ෂා කර ගැනීමටයි. රුසියාවට අවශය වූයේ මේ මඟින් කොන්ස්තන්තිනෝපලය හා බොස්පරස් ඩාඩලන්ස් යන ප්‍රදේශවල බලය ව්‍යාප්ත කිරීමයි. සර්ව ස්ලාව් ව්‍යාපාරය මර්දනය කිරීමට තුර්කියට සහාය දැක්වීමට ඔස්ට්‍රියාවටත්, රුසියානු ව්‍යාප්තියට බාධා කිරීමට ප්‍රංශයත් මේ සඳහා මැදිහත් වීමේ අරමුණු වී තිබුණි.

කෙසේ වුවද බෝල්කන් රාජ්‍යය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ නියැලී සිටි ස්ලාව් ජාතිකයන්ගේ එක්සත් කිරීමේ ඩැඩපිළිවෙලට ඔස්ට්‍රියාවෙන් සිදු වූ මේ බාධාව නිසා ඔවුහු රහස්‍ය සංවිධාන පිහිටුවා ගෙන ක්‍රියාත්මක විය. බලවත්ම සංවිධානය වූයේ සර්බියන් හමුදාවේ ඔත්තු සේවා අංශයේ ප්‍රධානියා වූ ඩ්‍රැගුටින් දිමිත්‍රිව්ගේ නායකත්වයෙන් යුත් '' බ්ලැක් හැන්ඩ්ස් " හෙවත්

ඒකාබද්ධතාව නැතහොත් මරණය නම් සංවිධානයයි. මෙසේ යුරෝපයේ තත්ත්වය බැරෑරුම් වෙත්දී බ්‍රිතාන්‍ය උත්සාහ ගත්තේ ජර්මනිය හා කිමියම් එක්සත් බවක් එකගතාවක් ඇති කර ගැනීමටය. නමුත් 1912 දී ඒ සියලුම උත්සාහයන් ව්‍යර්ථ වූයෙන් බ්‍රිතාන්‍ය ප්‍රංශ රුසියා පෙරමුණ එකිනෙකා කෙරේ තවත් ළං විය. මේ ප්‍රශ්නයේදී අතරමං වූ රුසියාව ප්‍රංශය හා මිතුදම් තර කර ගැනීමට සමත් විය. කෙසේ වුවද තුර්කි අධිරාජ්‍යයෙන් ගැලවීමත් නිදහස දිනා ගැනීමත් යන උත්සාහයන් අභියෝගයට ලක් වූ මේ අවස්ථාවේදී ස්ලාව් වැසියන්ට මේ යුරෝපා බලවතුන්ගේ පොරයටද මැදිහත්වීමට සිදු විය.

මේ නිසා බොල්කන් රාජ්‍ය අතර සංගමයක් බිහිවූ අතර තුර්කින් යම් දුරකට පාලනය කිරීමටත් ස්ලාව් වැසියන් සිටින මේ ප්‍රදේශයේ රටවල් යම් දුරකට එක්සත් කිරීමටත් ඊට හැකිවිය. ඔස්ට්‍රියාව සර්බියාව හා සටනකට අර ඇඳ අතර ඒ නිසාම 1912 දී බෝල්කන් සංගමය හා තුර්කිවරු අතර ගිවිසුමක් ඇති කරන ලදී. (සෙනෙවිරත්න,1966,පි. 179) පසුව බ්‍රිතාන්‍ය මැදිහත් වී මේ බෝල්කන් රාජ්‍යය බලවතුන් අතර බෙදා ගැනීමට ක්‍රියා කිරීමට ගිවිසුම් සකස් කළද ඊට කිසිවෙක් කැමති නොවීය. මේ අනුසාරයෙන් මේ බොල්කන් රටවල් අතර සටන් ඇතිවූ අතර ඒ අතරේම තුර්කිය විසින් බල්ගේරියාව කොල්ල කන ලදී. ඔස්ට්‍රියාවත් ජර්මනියත් එක්වී මේ සියලු දේ දෙස ඇස ගසා ගෙන සිටි අතර ස්ලාව් වැසියන්ගේ රහස් සංවිධාන සෑම විටෙකම මේ ද්වි පාර්ශවික හවුල කෙරේ (ඔස්ට්‍රියා-.ජර්මන්) වෛරයෙන් පසුවිය.

**සරයේවෝ සිද්ධිය හෙවත් යුද්ධයට ආසන්නතම හේතුව**

මෙම වෛරී අවස්ථාව පුපුරා යාම නිසා ඇතිවූ සිද්ධිය අඬන්න ඉන්න කෙනාගේ ඇසට ඇඟිල්ලෙන් ඇනීමක් සේ විය. එකිනෙකා හා ගැටීමට අවස්ථාවක් සොයමින් සිටි බලවතුන්ට මෙය යුද්ධයකට අවස්ථාවක්ම විය. 1914 ජූනි 28 වන ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමාරයා වූ ආච්ඩියුක් ෆ්‍රාන්ස් ෆර්ඩිනන්ඩ් කුමාරයා සහ ඔහුගේ බිරිඳ සර්බියාවේ සරයේවෝ නුවරදී බ්ලැක් හැන්ඩ්ස් නම් සංවිධානය විසින් ඝාතණය කරනු ලැබිණි. මෙහි සම්පූර්ණ වගකීම සර්බියාව වෙත පැවරූ ඔස්ට්‍රියාව මෙය තමන්ට එරෙහි යුධ ප්‍රකාශ කිරීමක් ලෙසින්ද සර්බියා ආණ්ඩුවේ අනුදැනුම මත සිදුවිණි යැයිද සලකන ලදී. සිද්ධියට සම්බන්ද සැකකරුවන් තමන්ට අල්ලා දෙන ලෙස ඔස්ට්‍රියාව කීවද එය සිදු කිරීමට අපොහොසත් විය. එසේම මේ පිළිබඳ කෙතරම් කරුණු පැහැදිලි කිරීමට සර්බියන් රජය උත්සාහ කළද එය නිශ්ඵල විය. සැබැවින්ම මෙය සර්බියන් රජයේ අනුදැනුම මත වූ ක්‍රියාවක් නොව උක්ත කී අන්දමේ රහස් තරුණ සංවිධානයක ක්‍රියාවක් පමණක් විය. කෙසේ වුවද සර්බියාවට එරෙහිව යුද වැදීමට සූදානමින් සිටි ඔස්ට්‍රියාව පැය 48 කට පෙර පිළිතුරු ලබා දෙන්නැයි කියමින් අවසාන නිවේදනයක් නිකුත් කළේය. ඊට සාධාරණ ලෙස පිළිතුරු දුන්නද නිශ්ඵල විය. ඔස්ට්‍රියාව යුධ වැදිණි. මේ අවස්ථාවේදි සර්බියාව රුසියාවේ ආධාර පතන ලදී.

මෙහි විනාශය මුලින්ම හඳුනා ගත්තේ බ්‍රිතාන්‍යයි. "මුළු යුරෝපය පුරාම පහන් නිවී ගෙන යන අතර අපගේ ජීවිත කාලයේදී නැවත ඒ පහන් එළිය අපට දක්නට නොලැබේ" යනුවෙන් බ්‍රිතාන්‍ය අගමැති ග්‍රේ විසින් සඳහන් කරන ලදී. බ්‍රිතාන්‍ය විසින් බලවත් වූ ජර්මනියෙන් ඉල්ලා සිටියේ බෙල්ජියම ආක්‍රමණය නොකරන ලෙසයි. එහිදී ජර්මනිය පැවසුවේ මෙහිදී බ්‍රිතාන්‍ය මධ්‍යස්ථ විය යුතු බවයි. එනම් තමන්ගේ පූර්වකාලීන සතුරා වූ ප්‍රංශය තනි කිරීමටයි. ඊට එකඟ නොවූ බ්‍රිතාන්‍යය අගෝස්තු 4 වන දා වන විටදි ප්‍රංශ රුසියන් සහයකයින් සමඟ ඔස්ට්‍රියා ජර්මන් පිලට එරෙහිව යුධ වැදී සිටියේය. මේ යුද්ධය වසර 4 ක් පුරාවට යුරෝපය අවුලුවාලීමට සමත් වූ අතර යුද්ධයට සම්බන්ද වූ සෑම රටකම හා සම්බන්ද නොවූ සෑම රටකටම වාගේ ආර්ථික සමාජීය දේශපාලනික හානි පැමිණිවීය. යුද්ධය අවසන් වුය් බ්‍රිතාන්‍ය ප්‍රමුඛ මිත්‍ර පිලට ජය අත්කර දෙමිනි. එසේම අතිවිශාල මිනිස් ජීවිත හා දේපල ප්‍රමාණයක් අහිමි කිරීමටද මේ යුද්ධය සමත් විය. කෙසේ වුවද මානව ඉතිහාසයේ තීරණාත්මක කඩයිමක් සේ සලකන්නාවූ මේ යුද අවස්ථාව යුරෝපය නව මාවතකට යොමු කරලීමට සමත් වුවා යැයි කීම සාවද්‍ය නොවේ. එනම් පළමුවන ලෝක යුද්ධය යුරෝපා ඉතිහාසයේ එක් සංධිස්ථානයක් කඩයිමක් ලෙසින් සලකනු ලැබීමයි. ඒ බව පහත අවස්ථා යටතේ පෙන්වා දිය හැකිය.

### 3. මෙම යුද්ධය යුරෝපා ඉතිහාසයේ කඩයිමක් සේ සැලකිය හැකිද ?

යම් යම් හේතු නිසා මේ යුද්ධ අවස්ථාව යුරෝපා මෙන්ම ලෝක ඉතිහසයේ සිමාවක් සේ සලකනු ලබයි. නැතහොත් පශ්චාත් යුධ සමයේ ඇතිවූ විවිධ වෙනස්විම ලෝකයටම බලපාන අන්දමින් ඇතිවූයේ මේ අවස්ථාව නිසාය. මේ සිද්ධිය ලෝක ඉතිහාසයේ සංධිස්ථානයක් වන්නේ කෙසේදැයි පහත ලෙසින් විමසිය හැකිය.

යුද්ධය නිසා ඇති කරන ලද්දාවූ විශේෂිත අවස්ථාවක් ලෙසින් ජාතීන්ගේ සංගමය හඳුන්වා දෙමු. මෙවැන්නක් පිහිටුවීමේ අරමුණ නම් නැවත මෙවැනි විනාශකාරි අවස්ථාවක් ඇතිවිමට ඉඩ ප්‍රස්ථා නැති කිරිමයි. මේ යුද්ධයේදී ඇතිවූ විනාශකාරී අවි සට්ටනය මෙවැනි සංවිධානයක හෝ ජාත්‍යන්තර ඒකාබද්ධ නීතියක අවශ්‍යතාව මැනැවින් පෙන්වන ලදී. නමුත් මෙම යුද්ධය ඇති විමට ප්‍රථමයෙන් ජාතීන් අතර ඇතිවන ගැටලු නිරාකරණය සඳහා ජගත් සංවිධානයක අවශ්‍යතාව තදින් දැනි තිබුණි. ඒ බව බ්‍රිතාන්‍යයෙන් දකුණු අප්‍රිකා නිළධාරීන් මෙන්ම ඇමරිකා ජනපති විල්සන් විසින්ද පෙන්වා දී තිබුණි. ඒ සඳහා සෑම රාජ්‍යයකට ස්වාධිපති අයිතිය ඇති බව පෙන්වා දුන් අතර ඒට බලපෑම් කිරිමට නොහැකි බව පෙන්වා දෙන ලදී. කෙසේ වුවද මේ සඳහා කෙටුම්පත් සකස් කොට 1919 පැරිස් සාම සම්මේලනයේදී එය ඉදිරිපත් කරන ලදී. ජාතීන්ගේ සංගමය පිහිටුවීම සඳහා කෙටුම්පත් කළ ලියවිල්ලට අනුව නිරායුධ කිරිම, යුද්ධ වැළැක්වීම, සමාජ සුබසාධනය මෙහි අරමුණු විය.

මෙසේ ජාතින්ගේ සංගමය ආරම්භ වූ අතර ප්‍රධාන ක්‍රියාකාරි මණ්ඩලය වු මහා මණ්ඩලය සඳහා සාමාජිකයන් පස් දෙනෙක් ඇතුලත් විය. මේ අනුබද්ධව කමිටු අනු කමිටු හා වෙනත් සංවිධාන බොහෝ සෙයින් පිහිටවු අතර කම්කරු සංවිධානය එවැන්නකි. මෙහිදි බ්‍රිතාන්‍යය, ඇමරිකාව, ප්‍රංශය, ඉතාලිය, ජපානය, වැනි රටවල් සඳහා වැඩි අවස්ථාවන් හා නිලතල හිමි වූ අතර ජර්මනිය ආක්‍රමණිකයෙක් සේ සැලකිණි. කෙසේ නමුත් යම් යම් පුද්ගලික හේතු මත මෙන්ම වන්දි ලැබීම වැනි හේතු මත ප්‍රංශය, බ්‍රිතාන්‍ය වැනි රටවල් මේ සංගමයේ කටයුතුවලින් ඈත් වි සිටි හෙයින් මෙය ජාතීන් කිහිප දෙනෙක්ට පමණක් සීමා විය. මානව වර්ගයාගේ යහපත උදෙසා උද්යෝගයෙන් හා කැපවීමෙන් කටයුතු කිරීමහා ජාතීන් අතර සහයෝගීත්වයක් ඇති කරලිම හා

- ආක්‍රමණකාරී අවස්ථාවලට යුද්ධය වෙනුවට සාමකාමී සාකච්ඡා මඟින් විසඳුම් සෙවිම.
- ලෝක බලවතුන් අතර සාමය හා සාමූහිකත්වය පවත්වා ගෙන යාම.

යනාදිය මෙම සංවිධානයේ අරමුණු විය. (පෙරේරා,1965,පි. 574). ලෝක සංවිධානයක් වු ජාතින්ගේ සංගමය ඇතිවිම කෙරෙහිද මේ යුද්ධය බලපාන ලද බව මින් පැහැදිලිය. එසේම එම සංවිධානය 1946 දී එක්සත් ජාතීන්ගේ මණ්ඩලය බවට පත්වන අතර වර්තමානයේදීත් අන්තර්ජාතිකව පවතින බලවත්ම සංවිධානයද එය වේ.

කාර්මික විප්ලවයත් සමඟ යුරොපීය රටවල වූ පිබිදීම හේතුවෙන් ඇතිවූ සෑම අංශයකම දියුණුව හා පරිවර්තනය මේ යුද අවස්ථාවේදී බෙහෙවින් ප්‍රයෝජනයට ගන්නා ලදී. කොටින්ම කිවහොත් කාර්මික විප්ලවයේ ඵලයක් සේ මේ අවස්ථාව සැලකිය හැකිය. කාර්මික විප්ලවයේ මහිමයෙන් නවීන තාක්ෂණික යුද අවි උපකරණ එකිනෙකා පරයමින් ඉදිරියට ආවේය. අති විශාල යුද නැව්, ගුවන් යානා මෙන්ම නවීන තුවක්කු, විෂ වායුන්, සබ්මැරීන් ප්‍රහාර, මෙන්ම විශේෂයෙන් යුද ටැංකි සංස්කෘතියක් මෙන්ම ඊට ප්‍රතිරෝධක වු යුද අගල් ක්‍රමය වැනි උපක්‍රමද ලෝකයට හඳුන්වා දුන්නේ මෙම යුද අවස්ථාව විසිනි. මේ සඳහා අලුතෙන් නිපදවන ලද සබ්මැරීන් යුද්ධය සඳහා බහුලවම යොදා ගැනිණ. නාවුක සටන්වලදී මේ සබ්මැරීන් දැක්වූයේ විශාල දායකත්වයකි. කලක් ගතවන විටදී මේ සබ්මැරීන් උවදුරක් බවට පත්විය. 1915 මැයි මසදී ජර්මනිය විසින් මගී නෞකාවක්ද විනාශ කර දමන ලදී. ඒ වන විටදි කාර්මික ජයග්‍රහණ හේතුවෙන් සන්නිවේදනය දියුනු මට්ටමක පැවතීම යුද්ධය තවත් තීව්‍ර කරවීය. මෙයින් පසු මෙම අවි ආයුධ මෙන්ම මෙකී උපක්‍රම හා සිද්ධාන්ත ලෝකයා විසින් ප්‍රයෝජනයට ගනු ලබයි. එසේම මෙය මෙතෙක් නොවූ විරූ වෙනස් ආකාරයේ යුද්ධයක් වූ අතර එය දෙවන ලෝක යුද්ධයකට මෙය මඟ පෙන්වන අවස්ථාවක්ද විය.

එදා මෙදාතුර ලෝකයේ බොහෝ දේශපාලන දර්ශන බිහිවිය. ඒ අතර ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රධාන ස්ථානයක් ගනී. මෙසේම මේ කාලය එනම් පශ්චාත් යුද සමය ෆැසිස්ට්වාදයට **සැබෑ ක්‍රියාකාරී උපත** ලබා දුන්නේය. රාජ්‍යය හා ජාතිය සියලු දේට වඩා උසස් බවත් පුරවැසියා යනු එහි එක් අවශ්‍යතාවක් පමණක් බවත් මේ මගින් පෙන්වා දිණි. " ශ්‍රී විභූතියෙන් පිරි ගොඩ නැගිල්ලක එම ශ්‍රී විභූතිය ගැන කතා කරනවා විනා එය සෑදී ඇති ගඩොල් පිළිබඳ කතා කිරිම නිශ්ඵල බව " මෙහි හරයයි. නිදහස හා සමානාත්මතාව අයිතිවාසිකම් සඳහා ලැබුනේ අඩු ඉඩකි. ඒ සියල්ලටම වඩා රාජ්‍යය ජාතිය උසස් සේ සැලකිණි. මේ දර්ශනය සඳහා අනුභූතිය වුයේ ජර්මන් රාජ්‍යයයි. යුද්ධයෙන් ජර්මනිය පරාජය විමත් සමඟ සිදුවූයේ ජර්මනිය වරදකරු කිරීමයි. (1919 වර්සෙල්ස් ගිවිසුම මගින්) එරටට නැවත නැගී සිටිමට අවශ්‍ය වු හෙයින් ඒ සඳහා යොදා ගත්තේ මේ දර්ශනයයි. ඇඩොල්ෆ් හිට්ලර් මේ ෆැසිස්ට් දර්ශනය දරුණු ලෙසින් ක්‍රියාත්මක කර ජර්මනියට යුරෝපයේ හිමි තැන ලබා දීමට උත්සාහ ගත්තේය. ඉතාලියේ තත්ත්වයත් මීට සමාන වූ අතර බෙනිටෝ මුසලෝනී එය ක්‍රියාත්මක කරවීය. මෙයින් පසු මේ රටවල් විසින් ගෙන ගිය ප්‍රත්පත්ති ලෝකය දෙවැනි වරටත් ලෝක යුද්ධයකට ඇද දැමීමට සමත් විය. එහෙයින් මේ පළමු යුද අවස්ථාව ලෝක ඉතිහාසයේ වැදගත්ම අවස්ථාවක් නිරූපණය කරයි දැක්විම සාවද්‍ය නොවේ.

යුරෝපයේ දේශපාලන සිතියම වෙනස් කිරීමට මේ යුද්ධය හේතුවක්ම විය. මෙවක් පටන් පැවති ලෝක සිතියම හා රටවල් මින් පසුව වෙනස් විය. වර්තමානයේදී දක්නට ඇති රාජ්‍යය වෙන් කිරීම් ඇති වීමට මේ සිදුවීම ප්‍රමාණවත් බලපෑමක් සිදු කරන ලදී. ඍජුවම කිවහොත් මින් සිදු වූයේ නැගෙනහිර යුරෝපා රටවල භූගෝලීය වෙනස්කමයි. ඒකාධිපති රාජාණ්ඩු හෝ යටත් විජිත බව බිඳවැටී ජාතිකත්වය මූලික කරගෙන ස්වාධින රාජ්‍ය බිහිවීම මේ මත සිදුවිය. ඔස්ට්‍රියා හංගේරියා අධිරාජ්‍යයේ බිඳවැටීම සමග ඊට ඇතුලත්ව තිබූ ප්‍රදේශ ස්වෛරී රාජ්‍ය යන ප්‍රතිපත්තිය යටතේ ස්වාධින රාජ්‍යය බවට පත් කෙරිණ. ඒ යටතේ පෝලන්තය, චෙකොස්ලෝවැකියාව, පින්ලන්තය, රුමේනියාව, යුගෝස්ලෝවියාව, ලිතුවේනියාව වැනි රටවල් මේ තත්ත්වය උදා කර ගත්හ. රුසියාවෙන් වෙන් වූ බෝල්ටික් රටවල් තුනක් වූ ලැට්වියාව එස්ටෝනියාව සහ ලිතුඒනියාව ද මෙසේ නිදහස් වී වෙනම රාජ්‍යය බවට පත් විය.

මෙකල සිදුවූ දේශපාලන දර්ශනවල වැඩි වර්ධනයද පළමු ලෝක යුද්ධය ඉතිහාසයේ සංධිස්ථානයක් කිරීමට සමත් විය. යුදාසන්න කාලයේදී ජර්මන් ඔස්ට්‍රෝ හංගේරියන් හා තුර්කි යන අධිරාජ්‍යවල ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රමවල ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවයක් නොතිබුණි. එතෙක් ප්‍රජාතන්ත්‍රවාදය න්‍යායක් ලෙසින් පැවතියද එය ක්‍රියාත්මක වූ අවස්ථා මෙම යුද්ධයෙන් පසුව ඇති විය. එනම් යුද්ධයේ අරමුණ වූ "ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ලෝකය සුරක්ෂිත කිරීම" යන්න තවදුරටත් න්‍යායක් පමණ වූයේ නැත. සැබැවින්ම එය ක්‍රියාත්මක වීම දක්නට ලැබුණි. උදා - ඒ අනුව 1920 පෙබරවාරි 20 දින සම්මත කරගත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් චෙකොස්ලෝවැකියාවේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් බිහි කරන ලදි. මේත් සමඟ ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් සේ පිළිගැනෙන ඡන්ද බලය ස්ත්‍රීන්ටත් ප්‍රදානය කිරීම මේ යුද්ධයෙන් පසු දැකිය හැකිවූ විශේෂ ලක්ෂණයක් විය. (පෙරේරා,1965,පි. 539) මිනිසාගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත් ඒ වෙනුවෙන් පෙනී සිටීමටත් රටවල් උනන්දු වූයේ මින් පසුවය. මේ යුද්ධයෙන් ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් යුරෝපා රටවල (විශේෂයෙන්ම නැගෙනහිර යුරෝපා රටවල) ප්‍රතිශ්ටාපනය වීම දක්නට ලැබේ.

ලෝක ඉතිහාසයේ සංධිස්ථානයක් සේ සැලකෙන 1917 රුසියන් විප්ලවය සඳහාද මේ පශ්චාත් යුද සමය බලපාන ලදී. රුසියාවේ සිටි ඒකාධිපති සාර්වරයාට එරෙහිව ලෙනින්ගේ නායකත්වයෙන් යුත් මෙම විප්ලවය ලෝකය වෙනත් මාවතකට යොමු කිරීමට සමත් විය. මේ සඳහාද යුද වාතාවරණය යම් ආලෝකයක් සපයන්නේ සාමය යන්න හේතුවක් කර ගනිමිනි. යුධ වාතාවරණය නිසා වූ විනාශය වෙනුවට සාමය යන සංකල්පයට විප්ලවිය සමයේදී මූලිකත්වයක් ලැබිම දක්නට ලැබේ.

මෙවන් යුද්ධාවලියක් මීට පෙර ලෝකයේ පැවතියේ හෝ ඇතිවී තිබුණේ හෝ නැත. යුද මෙන්ද යුද්ධාවලි මීට පෙර ඇති වී තිබුණද ඒවා සාම්ප්‍රදායික තත්ත්වයේ ඒවා විය. සාම්ප්‍රදායික ගතානුගතික අදහස්වලින් ඔබ්බට ගොස් නව චින්තන රටාවන් ඔස්සේ ඥානය මෙහෙයවන ලද

මිනිසුන්ගේ නවීන පන්නයේ යුද ක්‍රියාවලියක් ලෙසින් මෙය හඳුන්වාදීම නිවැරදිය. මේ මඟින් යුරෝපය පුරාම සියලු ජනී ජනයාගේ සිත් කම්පාවෙන් පිරවීමට සමත් විය. එසේම යුද්ධය නවතාලීමට ගත් සියලු උත්සාහයන්ද ව්‍යර්ථ වි ගියේය. **මානසික ලෙසින් මිනිසා විශාල ලෙස පිරිහීමට ලක්විය. මනුෂ්‍ය ශිෂ්ටාචාරය ආරම්භ වූ දා පටන් සිදු වූයේ එය ක්‍රමිකව සාධනීය ලෙසින් විකාශය වීමයි. එහෙත් මෙහිදි ඒ සියල්ල එක්වරම නැවති ගියා වැන්නක් සිදුවිය. මනුෂ්‍ය ශිෂ්ටාචාරය ඉදිරියට යන්නේ මෙලෙසින්දැයි මෙය ජයග්‍රහණයදැයි සැම දෙනාගේ සිත්තුළ විය. මේ සියල්ලටම හේතුව වුයේ බල ව්‍යාප්තියේ වූ ආශාවයි. අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තියයි. මේ යුද්ධය අධිරාජ්‍යවාදය සඳහා පහරක් එල්ල කිරීමට සමත් වූ ප්‍රමුඛතම අවස්ථාවක් විය.**

සමාජීය අංශයේදී මේ යුද්ධය සම්බන්දයෙන් බොහෝ වෙනස් විම් සිදු විය. ඒවා වෙනස් වීම් ම නොව මේ යුද්ධයත් සමඟ පැමිණි පැරණි තත්ත්වයෙන් ඔබ්බට ගිය අවස්ථාය. යුධ පෙරමුණ පැවතියේ බොහෝ විය මව් රටෙන් ඈත වෙනත් රටකය උදාහරණයක් ලෙසින් බ්‍රිතාන්‍ය හමුදා සටන් වැදුනේ ප්‍රංශයේය මේ හමුදා සඳහා සැපයුම් ලබාදීමට ඒ ඒ රටවල්වලට සිදු විය එහෙයින් යුද්ධය පවතින අතර මව් රටේ වෙනම සංස්කෘතියක් බිහිවිය. යුද්ධය සඳහා අවශ්‍ය උපකරණ වෙඩි බෙහෙත් මෙන්ම තුවාල වෙළන පටි නිපදවීම සිදුකළේ සැපයුම් කළ යුතු වූ රටේ කාන්තාවන් විසිනි. පුරුෂ පක්ෂය යුධ පෙරමුණට ගිය කල්හි එම රැකියා කළේ කාන්තාවන්ය. මේ අවස්ථාවේදී කාන්තාවන් විශාල මෙහෙයක් තම රට වෙනුවෙන් ඉටු කළේය. ලන්ඩන්හි බස් රියදුරන් ලෙසින්ද පැරිස්හි දුම්රිය රියදුරන් ලෙසින්ද සේවය කිරීමට කාන්තාවන්ට සිදු විය. මේ සම්බන්ධව බ්‍රිතාන්‍යය ප්‍රධාන අවස්ථා නිරූපණය කරයි. මෙම සංග්‍රාමයට පසුව ස්ත්‍රී පුරුෂ යන සංකල්ප කෙරේ මෙතෙක් පැවැති ආකල්පවල වෙනසක් ඇතිවිය. එදිනෙදා ජීවිතයේ පැවැති පුරුදු පවා යුද්ධය නිසා වෙනස් කිරීමට සිදු විය. ආහාර ලබා ගැනීමට පවා ස්ත්‍රීන්ට පෝළිම්වල සිටීමට සිදු විය. එසේම ඇඳුම් පැළඳුම් පවා වෙනස් වූ අතර කාන්තාවන් කලිසම ඇඳීමට පුරුදු වූයේ මේ යුද තත්ත්වයෙන් පසුවය. මේ සම්බන්දව කාන්තාවන්ගේ පරිත්‍යාග කෙතරම්ද යත් සමහර යන්ත්‍රවල සම්බන්ධීකාරක පටි සෑදීම සඳහා බ්‍රිතාන්‍ය කාන්තාවන්ගේ කෙසේ භාවිත කළේය. ඒ මගින් යන්ත්‍ර ක්‍රියාත්මක විය. මේ කාලයේදී ජාතිකානුරාගය ලාංකිකයන් තුළ ඇති කිරීම සඳහා ටිබෙට් ජාතික ඇස් මහින්ද හිමි විසින් රචිත නිදහසේ මන්තරය කෘතියෙහි " කෙස් ගස පවා වෙන රටවල මිනිසුන්නේ - උස් නිදහස පිණිස සටනට සැරසෙන්නේ " යනුවෙන් දක්වා ඇත්තේ මේ සිද්ධියයි. (ජයතිලක,2003,පි. 134)

ඇමරිකාව සතු වූ සම්පත් හමුවේ විග්‍රහ කර බලන්නේ නම් 1918 පමණ වන විටදී ඇමරිකාව ලොව බලවත් රටක් ලෙසින් පිළිගැනීමට සිදුවී තිබුණි. දෙවෙනි වූයේ ජපානයට පමණි. එමගින් ඉදිරියට පැමිණි ඇමරිකාව ජාත්‍යන්තර කටුයුතුවලදි ඇමරිකාවේ මැදිහත්වීම ප්‍රබලත්වයකට ඒමට මේ යුද්ධය සමත් විය. මේ වන තෙක් එවැනි ස්ථානයක ඇමරිකාව අත්කරගෙන නොතිබුණත් ඇමරිකාව ලෝක බලවතා ලෙසින් ජාත්‍යන්තරය ඉදිරියේ පෙනී සිටීමට මේ යුද්ධය තීරණාත්මක අවස්ථාවක් විය. ඒ සඳහා ඇමරිකාව ඇතුලු මිත්‍ර පාක්ෂිකයන් ජයග්‍රහණය කරවීමට ඇමරිකා ජනපති වූ වුඩ්රෝ විල්සන්ගේ කැපකිරීම ප්‍රබල හේතුවක්ම විය.

මිත්‍ර පිල හා සංගමය විසින් ජර්මනිය වරදකරු කොට සම්බාධක පැනවීය. ජර්මනිය සම්බන්ධයෙන් ගත් කළ මෙය ඉතා දුඃඛිත අවස්ථාවක් විය. ජර්මනියට දඬුවම් පැමිණවිය. යුද්ධයේ වරදකරු ජර්මනිය බව ප්‍රකාශ කළ අතර ජර්මනිය අල්ලා ගෙන තිබූ ඇල්සාස් ලෝරේන් ප්‍රදේශ නැවත ප්‍රංශයට පැවරිණි. එනම් පර්මන් දේශ සිමා වෙනස් විය. බෙල්ජියමේ නැගෙනහිර දේශ සීමාවලට අයත් ප්‍රදේශද නැවත බෙල්ජියමට පැවරීමට සිදුවිය. ජර්මනියේ ස්වභාවික සම්පත් සහිත ප්‍රදේශ වූ සාර් මිටියාවතේ පාලනය ජාතීන්ගේ සංගමටය පැවරුණ අතර දස ලක්ෂ ගණනකින් සිටි හමුදාව ලක්ෂයකට අඩු කරන ලදී. එසේම යුධ නැව් සම්මැරීන් තබා ගැනීමට ඉඩ ලබා දුන්නේ නැත. 1870 ප්‍රංශ ජර්මන් යුද්ධයේදී යුද වන්දි ජර්මනිය ලබා ගත් සේම වන්දි මුදල් මිත්‍ර පිල වෙත ගෙවීමට ජර්මනියට නියම කෙරිණ. යුද වන්දි වශයෙන් මුදල් පමණක් නොව ජර්මනිය සතු වෙනත් සම්පත් ද (යුධ නැව්, වෙළඳ නැව්, දුම්රි මාර්ග සඳහා ගෙන්වූ උපකරණද) වන්දි වශයෙන් ගෙවීමට යුද්ධයෙන් පසුව ජර්මනියේ පිහිටවූ වේමාර් ආණ්ඩුවට සිදුවිය. (ජයතිලක,2003,පි. 140)

මෙසේ ජර්මනිය සෑම අතකින්ම මර්දනය කිරීමට ලක් වූ අතර ලෝක ඉතිහාසය නව මාවතකට යොමු කරමින් කරමින් පළමු ලෝක යුද්ධය අවසන් විය.

- පළමු ලෝක යුද සමයේ යුරෝපය




### ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අලහකෝන්, එම්. ජේ, (2011), *යුරෝපය 1900 - 1950*, කතෘ ප්‍රකාශනයකි.

ඊලිප්සන්, (2007), *19/20 සියවස්වල යුරෝපය*, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

ග්‍රාන්ට්, ඒ. ජේ, (1965), *යුරෝපය ගතවූ පන්සිය වසෙහි කථාව*, (පරි.) පෙරේරා, පී ඇම්, ගුණසේන සහ සමාගම කොළඹ.

ජයතිලක, ඩබ්ලිව්. පී.(2003), *යුරෝපා ඉතිහාසය - නූතන යුගය*, 1800--2000, එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

තොම්සන්, ඩේවිඩ්, (1970), *නැපෝලියන්ගෙන් පසු යුරෝපය*, (පරි.), ක්නොෆ්, ඇල්ප්‍රඩ් ඒ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

මැරියට්, ජේ. ඒ. ආර්. (2005). *නූතන යුරෝපයේ විකාශය*, රාජ්‍ය භාෂා දෙපාර්තමේනතුව.

*යුරෝපා ඉතිහාසය*, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

රාවෝ, බී වී,(2003), *ලෝක ඉතිහාසය*, (පරි.), ඇඳගම, මාලනී, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.